# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1876/31 – 2014 අගෝස්තු මස 20 වැනි බදාදා - 2014.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරන වාරිමාර්ග ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2014.06.03 වැනි දින සම්මත කරන ලදුව, 2014.07.31 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

පද්මිණී කාරියවසම්,  
සභා ලේකම්,  
වයඹ පළාත් සභාව.

2014 අගෝස්තු මස 13 වැනි දින,  
කුරුණෑගල,  
වයඹ පළාත් සභාවේ,  
සභා කාර්යාලයේ දී ය.

**වයඹ පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරන වාරිමාර්ග ප්‍රඥප්තිය**

***වයඹ පළාත් කෘෂිකර්ම සුළු වාරිමාර්ග, ගොවිජන සංවර්ධන සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය (වයඹ)***

වයඹ පළාත තුළ පිහිටි පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරි මාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියලු වාරිමාර්ග වැඩ සම්බන්ධ ක්‍රම සම්පාදනය, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම, නඩත්තු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා සහ ඊට අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාත් වයඹ පළාතේ පළාත් සභාවේ 2004 අංක 03 දරන සුළු වාරිමාර්ග සහ ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහාත් වූ ප්‍රඥප්තියකි. දීර්ඝ නාමය

මෙම ප්‍රඥප්තිය 1951 අංක 01 දරන වාරිමාර්ග (සංශෝධන) පනත, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනත, 1973 අංක 37 දරන වාරිමාර්ග (සංශෝධන) පනත, 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පනත. 1990 අංක 34 දරන වාරිමාර්ග (සංශෝධන) පනත හා 1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන) පනත යන පනත් වලින් සංශෝධිත 1948 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරන වාරිමාර්ග ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ක්‍රියාත්මක වන දිනය

2. වයඹ පළාත් සභාවේ අනුමැතියෙන් පසුව වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වේ.

ප්‍රඥප්තියේ අරමුණු

3. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ :

(1) පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බනධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියලුම වාරිමාර්ග එල්ලංගා පද්ධති, ජලාශ. අමුණු, ඇළ දොළ, ජල උල්පත් හා වාරි රක්ෂිත හා පෝෂිත ප්‍රදේශ පිළිබඳ සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය සහ වාරි කර්මාන්ත වල සීමා මායිම් නිර්ණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(2) වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(3) වයඹ පළාත් වාරිමාර්ග කමිටුව පිහිටුවීම.

(4) වාරි කළමනාකරණ හා සංවර්ධ කමිටු සහ වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටු පිහිටුවීම.

(5) ස්වාභාවික කෘෂි කර්මාන්තය පදනම් කරගත් කෘෂි සංස්කෘතියක් ස්ථාපිත කිරීම.

(6) වයඹ පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල කළමනාකරණය.

(7) වාරි පද්ධතියේ තිරසාර සංවර්ධනයට අදාල කටයුතු සම්පාදනය කිරීම.

## *I වන පරිච්ඡේදය*

### *පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම, එහි සංයුතිය, බලතල හා කාර්යභාරය*

දෙපාර්තමේන්තුව පිහිටුවීම

4. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා "වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව" යනුවෙන් දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතු ය.

දෙපාර්තමේන්තුව නීතිගත ආයතනයක් බව

5. මෙම දෙපාර්තමේන්තුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් වාරිමාර්ග වලට අදාල සියලු කටයුතු ඉටු කිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කිරීමට ද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේ ය.

දෙපාර්තමේන්තුවේ සංයුතිය

6. මෙම දෙපාර්තමේන්තුව පළාත් අධ්‍යක්ෂ වරයෙකුගෙන් ද, නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙකුගෙන් ද, සහකාර අධ්‍යක්ෂවරුන්ගෙන් හා අනිකුත් නිලධාරීන්ගෙන් සහ සේවකයන්ගෙන් ද සමන්විත වන්නේ ය.

අධ්‍යක්ෂවරයා පත් කිරීම

7. වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා "වයඹ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා" යනුවෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන පංතියේ නිලධාරියෙකු විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු වේ.

රජයේ නිලධාරීන්ද පත්කළ හැකිබව

8. මනා කළමනාකරණයක් සඳහා අන්තර් සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කිරීමට රජයේ නිලධාරීන් වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙස පත්කර ගත යුතු අවස්ථාවක ඊට අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය ලබාගෙන පත් කිරීමට ද බලය ඇත්තේ ය.

9. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත්කරනු ලන සියලුම නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් වශයෙන් සැළකිය යුතු ය. රජයේ සේවකයන් බව

10. වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය පහත සඳහන් පරිදි වේ. දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය

(1) පවතින වාරිමාර්ග ක්‍රම වඩාත් ඵලදායි අයුරින් සැලසුම් කිරිම.

(2) වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම, වාරිමාර්ගවල සීමා මායිම් නිර්ණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(3) නව වාරිමාර්ග ක්‍රම වඩාත් ඵලදායී අයුරින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(4) පළාත් වාරිමාර්ග වාර්ෂික සැලැස්ම සකස් කර ඒ සඳහා ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීම.

(5) වාරික්‍රම වල පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම, සංරක්ෂණය, නඩත්තුව සහ ආරක්ෂාව සඳහා වාරිමාර්ග කමිටුවල සහභාගිත්වය ලබා ගැනීමට කටයුතු කිරීම.

(6) වාරික්‍රමවලට හානි පමුණුවන පුද්ගලයින්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම.

(7) වාරි රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

(8) වගා ප්‍රදේශ හා ප්‍රමාණය නිර්ණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

(9) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අනිකුත් කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට කෘෂිකර්මික වැඩසටහන් සඳහා අවශ්‍ය ආයතනික සහය ලබාදීම.

(10) ජල කළමනාකරණය හා ඒකාබද්ධ ආක්‍රමණික ජලජ පැලැටි කළමනාකරණයට සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(11) වාරි ක්‍රම අබලන්වීම හා විනාශවීමට තුඩුදෙන පාරිසරික හානි වැලැක්වීම, පාරිසරික හානි අවම කිරීම හා පරිසර පද්ධති සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.

(12) වාරික්‍රම යටතේ සහ වාරි ක්‍රම යටතේ නොවන කුඹුරු වගා කිරීම සඳහා වගා කාල සැලසුම් පිළියෙල කිරීමට අවශ්‍ය සහාය ලබාදිම.

(13) දෙපාර්තමේන්තුවේ විෂයය පථයට අයත් තොරතුරු පද්ධතිය සකස් කිරීම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.

(14) වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු ලියාපදිංචි කිරීම, කමිටු සඳහා මඟ පෙන්වීම, උපදෙස් දීම සහ කාර්යය පරිපාටි සකස් කිරීම.

(15) වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ සහ වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ ගිණුම් කටයුතු පිළිබඳ සීමා පැනවීම සහ අධීක්ෂණය කිරීම.

(16) යම් කිසි වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවක ගිණුම් පරීක්ෂාවෙන් පසුව මුදල් හෝ වත්කම් යම් සාමාජිකයෙකු හෝ සමිතියේ නිලධාරියෙකු විසින් අවභාවිතා කිරීම හෝ විෂමාචාර කටයුතු සිදුකර ඇත්නම් ඒ පිළිබඳ නීතිමය පියවර ගැනීම.

(17) වාරික්‍රමවල අතිරේක ජලය ප්‍රයෝජනය ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම.

(18) වාරි කර්මාන්ත හා සම්බන්ධ මාර්ග සංවර්ධනයට කටයුතු කිරීම.

(19) වාරිමාර්ග ප්‍රතිසංස්කරණ සහ නියමිත ජල ධාරිතාවය පවත්වාගෙන යාම සඳහා වාරි කළමනාකරණ කමිටුවලට පස් හෝ රොන් මඩ ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබාදීම.

(20) වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුව විසින් සහතික කරන ලද වගා ප්‍රදේශ හා ප්‍රමාණ ලේඛනය අනුමත කිරීම.

(21) වාරි කර්මාන්තයක් පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ සංරක්ෂණය කිරීමට අදහස් කරන්නා වූ යම්කිසි ආයතනයක්, සංවිධානයක් හෝ කණ්ඩායමකට ඒ සඳහා අනුමැතිය ලබාදීම.

පළාත් අධ්‍යක්ෂ සතු බලතල

11. ලේකම්වරයාගේ සාමාන්‍ය පරිපාලනයට යටත්ව මෙම ප්‍රඥප්තියෙහි හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා හෝ පනවනු ලබන නියෝග හෝ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලතල අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේ ය.

අධ්‍යක්ෂවරයාගේ බලතල පැවරීම

12. අධ්‍යක්ෂවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ස්වකීය බලතල දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් හට පවරා ක්‍රියාත්මක කළ හැකි වන්නේ ය.

කලාප හෝ දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීම

13. වාරි කළමනාකරණ කටයුතුවල ඵලදායි කළමනාකරණයක් සඳහා කලාප හෝ දිස්ත්‍රික් කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකි වන්නේ ය.

## *II වැනි පරිච්ඡේදය*

### *පළාත් වාරිමාර්ග කමිටුව*

පළාත් වාරිමාර්ග කමිටුව

14. පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම පහසු වනු පිණිස වයඹ පළාත් වාරිමාර්ග කමිටුව නමින් පළාත් වාරිමාර්ග කමිටුවක් ස්ථාපිත කළ යුතු වන්නේ ය. පළාත් වාරිමාර්ග විෂය අමාත්‍යවරයා මෙම කමිටුවේ සභාපතිවරයා වන අතර පළාත් වාරිමාර්ග විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා කමිටුවේ ලේකම්වරයා වන්නේ ය. මෙම කමිටුව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන කමිටුව හා පළාත් කෘෂිකර්ම කමිටුව සමග ඒකාබද්ධව පැවැත්විය හැකි වන්නේ ය.

කමිටුවේ සංයුතිය

15. (1) මෙම කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු වන්නේ ය ඃ

i. පළාත් වාරිමාර්ග විෂයයභාර අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරුන්,

ii. කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරුන්,

iii. වයඹ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ

iv. වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය අධ්‍යක්ෂ

v. වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,

vi. වයඹ පළාත් ඉඩම් කොමසාරිස්,

vii. වයඹ පළාත් ඉංජිනේරු අධ්‍යක්ෂ,

viii. වයඹ පළාත් ධීවර අධ්‍යක්ෂ,

ix. වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්,

x. කුරුණෑගල සහ පුත්තලම නියෝජ්‍ය පොලිස්පතිවරු,

xi. කුරුණෑගල සහ පුත්තලම කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්,

xii. කුරුණෑගල සහ පුත්තලම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය හෝ සහකාර කොමසාරිස්වරුන්,

xiii. වයඹ පළාත් පරිසර අධිකාරියේ පළාත් අධ්‍යක්ෂ,

xiv. කුරුණෑගල සහ පුත්තලම ජාතික ජලජීවී හා වගා සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් ප්‍රධානීන්,

xv. කුරුණෑගල සහ පුත්තලම කෘෂිකර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් කළමනාකරුවන්,

xvi. කුරුණෑගල සහ පුත්තලම වන සංරක්ෂණ දිස්ත්‍රික් නිලධාරීන්,

xvii. වනජීවී දෙපාර්තමේන්තුවේ වයඹ පළාත් වනජීවී අධ්‍යක්ෂ,

xiii. වී අලෙවි මණ්ඩලයේ වයඹ පළාත් කළමනාකරු,

xix. කුරුණෑගල සහ පුත්තලම ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ප්‍රධානීන්,

xx. වාරිමාර්ග පිළිබඳ විශේෂ දැනුමක් අති ප්‍රවීණයන් දෙදෙනෙකු,

xxi. වාරි කළමනාකරණ සහ සංවර්ධන කමිටු නියෝජිතයන් දෙදෙනෙකු,

xxii. පළාත් තුළ ක්‍රියාත්මක වන කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන සහ වාරිමාර්ග කටයුතු වලට අදාළව ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රධානීන් දෙදෙනෙක්,

(2) අවස්ථානුකූලව අමාත්‍යවරයා විසින් රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන හෝ සංවිධානවල නියෝජිතයන් වාරිමාර්ග කමිටුවට කැඳවිය හැක්කේ ය.

16. මෙම ප්‍රඥප්තියේ 15(1), උප වගන්තියේ i සිට xix දක්වා සාමාජිකයන් නිල බලයෙන් පත්වන අතර xx සිට xxii දක්වා සාමාජිකයින් අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි පත්කළ හැක්කේ ය. කමිටුවේ සාමාජිකයින් පත් කිරීම

17. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින්ගේ ධුර කාලය වසර එකක් වන්නේ ය. සාමාජිකයින්ගේ ධුර කාලය

18. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින්ගේ ධුර කාලය සම්පූර්ණවීම, ධුරයෙන් ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ධුරයෙන් ඉවත් කිරීම, අනුගාමී රැස්වීම් වාර තුනකට සහභාගී නොවීම හෝ සාමාජිකයෙකුගේ මරණය හෝ සිහි විකලත්වය මත සාමාජිකත්වය අහෝසි වන අතර එම පුරප්පාඩුව අමාත්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු වන්නේ ය. සාමාජිකත්වය අහෝසිවීම

19. පළාත් කමිටුව යටත් පිරිසෙයින් මාස දෙකකට එක් වරක් බැගින් රැස්විය යුතු වන්නේ ය. අවශ්‍ය වන්නේ නම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම්වරයා විසින් අතිරේත රැස්වීම් කැඳවනු ලැබිය හැකිය. කමිටුවේ රැස්වීම්

20. (1) කමිටුවේ ගණ පූර්ණය සාමාජිකයින්ගෙන් 1/4 විය යුතු ය. ගණ පූර්ණය

(2) සාමාජිකයින්ගේ පුරප්පාඩු පැවතීම කමිටු රැස්වීම් පැවැත්වීමට හෝ රැස්වීම්වල තීරණ ගැනීම සඳහා බාධාවක් නොවන්නේ ය.

21. පළාත් වාරිමාර්ග කමිටුවේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ. කමිටුවේ බලතල හා කාර්යභාරය

(1) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පළාත් වාරිමාර්ග වලට අදාළ ප්‍රඥප්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් පළාතට අදාල ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කරවීම.

(2) ප්‍රඥප්තියේ සඳහන් කාරණා මෙහෙයවීමට සහ ක්‍රියාවේ යෙදවීමට අදාළ උපදෙස් ලබා දීම.

(3) පළාත් වාරිමාර්ග වාර්ෂික සැලැස්ම සකස් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම, උපදෙස් සහ මඟ පෙන්වීම ලබාදීම.

(4) පළාත් වාර්මාර්ග සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් සහ සහය ලබා දෙමින් ඒ පිළිබඳ පසු විපරම සහ ඇගැයීම.

(5) පළාත් තුළ වාරිමාර්ග සැලසුම් සකස් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළුවලදී අවශ්‍ය තීරණ ලබා දීම.

(6) පළාත තුළ කිසියම් ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක්, වැඩ සටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක් විසින් වාරිමාර්ගවලට අදාල කිසියම් ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් අනුමැතිය ලබාදීම.

(7) වාරිමාර්ග, ඵලදායීව යොදා ගන්නා බවට වගබලා ගැනීම.

කාර්යය පටිපාටි හා සහභාගිත්ව දීමනා

22. (1) කමිටුව විසින් එහි රැස්වීම්වල කාර්යය කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්යය පටිපාටි සම්පාදනය කරගත හැක්කේ ය.

(2) පළාත් කමිටුවේ රැස්වීම්වලට සහභාගී වන්නන් වෙනුවෙන් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැක්කේ ය.

*III වැනි පරිච්ඡේදය*

**පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල**

පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල

23. මෙහි මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන වයඹ පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල යනුවෙන් අරමුදලක් පිහිටවනු ලැබේ.

අරමුදල නීතිගත සංස්ථාවක් බව

24. අරමුදල අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් වාරිමාර්ගවලට අදාළ නඩත්තු කටයුතු ඉටු කිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද බලය ඇති නීතිගත සංස්ථාවක් බවට පත්වන්නේ ය.

වත්කම් සහ බැරකම් පැවරෙන බව

25. 2004 අංක 3 දරන සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදල් ප්‍රඥප්තිය යටතේ පිහිටුවා තිබූ සුළු වාරිමාර්ග හා ග්‍රාමීය මාර්ග නඩත්තු අරමුදලේ සියළු වත්කම් සහ බැරකම් මෙම ප්‍රඥප්තියේ 23 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදලට පැවරෙන්නේ ය.

අරමුදලේ භාරකාරිත්වය

26. අරමුදලේ භාරකාරිත්වය වයඹ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා භාරයේ තැබිය යුත්තේ ය.

නඩත්තු අරමුදල් කළමනාකරණ මණ්ඩලය

27. අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සමන්විත වන වයඹ පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදලේ කළමනාකරණ මණ්ඩලය සතු වන්නේ ය.

කළමනාකරණ මණ්ඩලය

28. මින් මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන පළාත් වාරිමාර්ග කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වන්නේ ය.

1. වාරිමාර්ග විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම්,

2. වයඹ පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය කළමනාකරණ),

3. වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,

4. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ එකඟත්වය ඇතිව පත්කරනු ලබන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික් ප්‍රධානීන්,

5. පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අංශයේ පධානි,

6. පළාත් වාරිමාර්ග විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයෙකු,

7. පළාත් වාරිමාර්ග විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කයන්හි කෘෂිකර්ම කලාප නියෝජනය වන පරිදි වාරි කළමනාකරණ සහ සංවර්ධන කමිටු නියෝජිතයන් දහ දෙනෙකු,

29. (1) වයඹ පළාත් වාරිමාර්ග විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ ය. කළමනාකරණ මණ්ඩලයේ සභාපති, ලේකම්

(2) පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ ලේකම්වරයා වන්නේ ය.

30. මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම හා ධුර කාලය මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම

(1) මණ්ඩලයේ සාමාජිකයෙකුගේ ධුර කාලය පත්කල දින සිට වසර තුනක කාලයක් සඳහා වන පරිදි අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(2) නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයෙකු හැර වෙනත් සාමාජිකයෙකු ධුරයේ වගකීම් යථා පරදි නොදරන බවට හෝ එම තනතුරු දැරීම හානිකර යැයි අමාත්‍යවරයාට ඒත්තු යන ඕනෑම අවස්ථාවක එම ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට පූර්ණ බලය ඇත්තේ ය.

(3) නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයෙකු එම නිලය දැරීම අවසන් වනවාත් සමඟම ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන අතර අනුප්‍රාප්තික තැනැත්තා ඉතිරි කාලය සඳහා පත්කළ යුත්තේ ය.

(4) අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලිඛිත ඉල්ලීමක් මගින් නිල තත්ත්වය මත පත් කරන ලද සාමාජිකයෙකුට සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට අවකාශ ඇත්තේ ය.

(5) සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ඇතිවන පුරප්පාඩුවක් සඳහා නැවත පත් කරනු ලබන තැනැත්තෙකුගේ ධුර කාලය පූර්ව සාමාජිකයා පත්කරන ලද ධුර කාලයෙන් ඉතිරි කාලයට සීමා විය යුතු ය.

31. මණ්ඩලයේ ගණ පූර්ණය එහි සාමාජිකයන්ගෙන් 1/3 විය යුතු ය. ගණ පූර්ණය

32. මෙම මණ්ඩලයේ සාමාජිකයන්ට සහ ලේකම්වරයාට වයඹ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය නිශ්චය කරනු ලබන දීමනාවක් ගෙවිය හැකි වන්නේ ය. දීමනාවක් ගෙවිය හැකි බව

33. අරමුදල නමින් වෙනම බැංකු ගිණුමක් රාජ්‍ය බැංකුවක, පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් පවත්වාගෙන යා යුතු ය. අතිරික්ත අරමුදල් රැස්වන අවස්ථාවේදී රාජ්‍ය බැංකුවට ස්ථාවර තැන්පතුවක එම මුදල් තැන්පත් කිරීමට කටයුතු කළ හැකිය. අරමුදලේ ගිණුම

34. මෙම අරමුදලේ සංයුතිය පහත සඳහන් පරිදි වේ : අරමුදලේ සංයුතිය

(1) වාර්ෂිකව පිළියෙල කරනු ලබන වාරිමාර්ග තිරසාර නඩත්තු ඇස්මේන්තු සඳහා පළාත් සභා අරමුදලින් සපයනු ලබන 50%ක මුදල්,

(2) රජයේ ආයතන විසින් ලබා දෙනු ලබන අරමුදල්,

(3) වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ දේශීය හා විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති වලින් ලැබෙන මුදල්,

(4) වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබිය හැකි ප්‍රදානයක්, තෑගි වශයෙන් හෝ අන්‍යාකාරයෙන් ලැබිය හැකි මුදල්,

(5) කාලීන හා ස්ථාවර තැන්පත් වලින් ලැබෙන පොළී මුදල්

(6) පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය සඳහා රජයෙන්, පළාත් සභා හෝ වෙනත් ආයතන විසින් වෙන් කරනු ලබන මුදල්,

(7) වාරිමාර්ග ප්‍රතිසංස්කරණයකදී ඉවත් කරන රොන් මඩ, පස් ආදිය අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් කොටසක්,

අරමුදලේ වියදම් දැරීම

35. කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව පහත කරුණු සම්බන්ධයෙන් අරමුදලේ මුදල් යෙදවීමට වාරිමාර්ග අධ්‍යක්ෂවරයාට හැක්කේ ය.

(1) වාරිමාර්ග අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් අනුමත කරන ලද වාර්ෂික නඩත්තු ඇස්තමේන්තුවෙන් 50%ක දායක මුදල් අදාල වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ ගිණුමේ තැන්පත් කර ඇති වාරි කර්මාන්ත සඳහා 50%ක දායකත්වය ගෙවීම.

(2) යම් වාරි කර්මාන්තයක් සඳහා ගෙවනු ලබන නඩත්තු කළමණාකරුගේ ශ්‍රම දීමනාව ඔහුගේ කැමැත්ත පරිදි ගොවි සංවිධානයට ගෙවීම.

(3) සාර්ථකව නඩත්තු කටයුතු කරගෙන යන වාරි කර්මාන්ත සඳහා තීරණය කරන ලද උපරිමයකට යටත්ව නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය වන උපකරණ මිලදී ගැනීමට දායකත්වය ලබා දීම.

(4) තිරසාර නඩත්තු වැඩපිළිවෙල සඳහා හෝ නඩත්තු වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අංශයේ අත්‍යාවශ්‍යතාවයන් සඳහා මණ්ඩලය විසින් වෙන් කරනු ලබන මුදල් ගෙවීම.

(5) වාරි කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයාට සහ අනෙක් සියළුම සාමාජිකයන්ට මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් වන ගෙවීම.

අරමුදලේ ගිණුම් කටයුතු

36. (1) අරමුදලේ සියළු ආදායම් සහ වියදම් ගිණුම් පවත්වා ගැනීම වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් කළ යුතු ය.

(2) රජයේ විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම විගණනය කළ යුත්තේ ය.

නියෝග සෑදීම

37. මණ්ඩලයේ බලතල වගකීම් කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා බල ගැන්වීම සම්බන්ධයෙන් ආනුෂංගික වූ කරුණු සඳහා අවශ්‍ය වන නියෝග පැනවීමට විෂය භාර අමාත්‍යවරයාට හැකිය.

## *IV වන පරිච්ඡේදය*

### ***වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු පිහිටුවීම සහ ඒවායේ බලතල***

වාරි කළමනාකරණ සහ සංවර්ධන කමිටු පිහිටුවීම

38. වාර් මාර්ග අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලබන යම් වාරි පෝෂිත වගා ප්‍රදේශයක් සඳහා වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය යුතු ය.

කමිටු නීතිගත ආයතනයක් බව

39. කමිටුව පළාත් වාරි කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි විය යුතු අතර එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් වාරිමාර්ග වලට අදාල සියළු කටුයුතු ඉටු කිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කිරීමට ද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේ ය.

සාමාජිකත්වය හා ආශ්‍රිත සාමාජිකත්වය

40. (1) කෘෂි කර්මාන්තය තම ජීවිකාව කරගත් සෑම තැනැත්තෙක්ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම්,

II. වයස අවු 18කට නොඅඩු නම් හා,

III. තමා සාමාජිකත්වය අපේක්ෂා කරන වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු බල ප්‍රදේශයේ කෘෂි කාර්මික කටයුතු වල නිරත වී සිටී නම් මෙම ප්‍රඥප්තියේ 38 වගන්තිය යටතේ පිහිටුවනු ලබන වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ සාමාජිකත්වය ලබා ගත හැක්කේ ය.

(2) මෙම ප්‍රඥප්තියේ 38 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වාරි කළමණාකරන හා සංවර්ධන කමිටුවක ආශ්‍රිත සාමාජිකත්වය,

I. තම ප්‍රධාන ජීවිකාව කෘෂිකාර්මික නොවන අතර කමිටු බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩමක හිමිකරු හෝ පදිංචි කරුවෙකුට,

II. කෘෂිකර්මයට අදාළ ආදායම් නිෂ්පාදන හෝ කෘෂිකාර්මික නිෂ්පාදන හෝ භාණ්ඩ අලෙවියෙහි නිතර වූ අදාළ ප්‍රදේශයෙහි පදිංචි යම් තැනැත්තෙකුට ලබා ගත හැක්කේ ය.

(3) උපදෙස් හා අදහස් ලබා ගැනීම සඳහා පමණක් වාරි කළමණාකරණ හා සංවර්ධන කමිටුවකට ආශ්‍රිත සාමාජිකයන් බඳවා ගැනීමට බලය ඇති අතර, ආශ්‍රිත සාමාජිකයන් හට ඡන්ද බලය හෝ නිලතල දැරීමට අවස්ථාව හෝ හිමි නොවේ.

41. සෑම වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් විසින්ම ස්වකීය නිලධරයන් ලෙස සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, උප ලේකම් සහ සාමාජිකයන් 6කට නොඅඩු කාරක සභාවක් තෝරාගනු ලැබිය යුතු අතර ඔවුන්ගේ ධුර කාලය පත් වූ දින සිට මාස දොළහක් (මාස 12) වේ. වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ සංයුතිය හා ධුර කාලය

42. I. අධ්‍යක්ෂවරයා විසින් සකස් කර අමාත්‍යවරයාගේ අනුමැතිය ලත් පොදු ව්‍යවස්ථාව අනුව වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටු කටයුතු කළ යුත්තේ ය. කමිටු ව්‍යවස්ථාව හා ආනුශංගික කටයුතු

II. කමිටු රැස්වීම් පවත්වාගෙන යාම, කමිටු කර්තව්‍යය, කමිටුවල ගිණුම් කටයුතු හා ආනුෂංගික කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග පනවනු ලැබිය හැක්කේ ය.

43. වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවල බලතල හා කාර්යභාරය, කමිටුවේ බලතල හා කාර්යභාරය

(1) කෘෂිකාර්මික ඉඩම්වල හෝග වගා කිරිම හා කුඹුරු ඉඩම් වල වී වගා කිරීම සඳහා සැළසුම් සකස් කිරීම හා පහසුකම් සැපයීම.

(2) කෘෂිකාර්මික කටයුතු වලට අදාළ චාරිත්‍ර වාරිත්‍ර සිදු කිරීම බලාත්මක කිරීම සහ අනුබලදීම

(3) වාරි කළමනාකරණ කටයුතු නිසි කලට වේලාවට කරනු ලබන බවට වගබලා ගැනීම.

(4) වාර් කාර්මාන්ත වලින් සැපයෙන ජලය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම.

(5) යම් කුඹුරු ඉඩම වගාවන්ට බාධාවක්ව තිබෙන වනාත කපා ඉවත් කිරිමට පියවර ගැනීම.

(6) තම බල ප්‍රදේශයට අයත් සෑම වාරි කර්මාන්තයක් වෙනුවෙන්ම තිරසාර නඩත්තු අරමුදලක් පිහිටුවීම හා වාරි කර්මාන්තය නමින් තිරසාර නඩත්තු ගිණුමක් පවත්වා ගැනීම.

(7) තිරසාර නඩත්තු අරමුදල පිහිටුවා ගැනිම සඳහා භුක්ති විඳින ඉඩම් ප්‍රමාණයට සාපේක්ෂව ඇස්වැන්නෙන් වාරි කළමනාකරණ කමිටුව විසින් නියම කරගත් ප්‍රමාණයක් දායක කර ගැනීම.

(8) වැවේ නඩත්තුව, ආරක්ෂාව සහ ජල කළමනාකරණය සඳහා කටයුතු කිරීම.

(9) වාරි මාර්ග වල සීමා මායිම් නිර්ණය කිරිමට අවශ්‍ය සහයෝගය ලබා දීම.

(10) ආක්‍රමණික ජලජ පැලෑටි කළමනාකරණය

(11) මිරිදිය ධීවර වැඩසටහන් සම්බන්ධිකරණය

(12) සෑම වාරි කර්මාන්තයක් යටතේම වාර්ෂිකව නඩත්තු ඇස්තමේන්තුවක් සකස් කර ඇස්තමේන්තු මුදලින් අවම වශයෙන් 50%ක දායකත්වයක් ගොවීන් විසින් ඔවුන්ගේ ගිණුමක තැන්පත් කර ඇති බව තහවුරු කර ගැනීම.

(13) වාර්ෂික ඇස්තමේන්තුවෙන් පරිබාහිරව හදිසි අවස්ථා වලදී වාරි කර්මාන්තය ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

(14) මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අය නීතිය ඉදිරියට ගෙන යාමට සහාය දැක්වීම.

(15) අධිකරණය විසින් නියම කරන දඩ මුදල් බැර කර ගැනීම.

රැස්වීම් හා ගණ පූර්ණය

44. (1) වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ රැස්වීම් මාසිකව හෝ ද්වි මාසිකව පැවැත්විය යුතු ය.

(2) කමිටු රැස්වීමක ගණ පූර්ණය එහි සාමාජිකයන්ගේ තුනෙන් එකකට (1/3) වඩා වැඩි විය යුතු ය.

ජල, නඩත්තු පැළෑටි කළමනාකරු තෝරා ගැනීම හා ධූර කාලය

45. (1) කමිටුවේ සාමාජිකයන්ගේ වැඩි කැමැත්තෙන් ජල කළමනාකරු, නඩත්තු කළමනාකරු සහ පැලෑටි කළමනාකරු වශයෙන් පුද්ගලයන් තිදෙනෙකු හෝ එම කාර්යයන් සඳහා එක් අයෙකු හෝ දෙදෙනෙකු තම සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගත යුතු ය.

(2) නඩත්තු, ජල, පැළෑටි කළමනාකරුවන් තෝරා පත්කල දිනයේ සිට මාස දොලහක (මාස 12) කාලයක් සිට ධුරයෙහි නිරත විය හැකිය.

ධූරය අවසන්වීම

46. (1) වාරිමාර්ග හා සංවර්ධන කමිටු වෙත යවනු ලබන ඉල්ලා අස්වීමේ ලිපියක් ඉදිරිපත් කර කළමණාකරුට සිය ධූරයෙන් ඉවත්විය හැකිය.

(2) i. කමිටු සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත හෝ අකාර්යක්ෂමතාවය හෝ අකටයුතුකම් පදනම් කරගෙන අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දරන ලද පරීක්ෂණයකින් හෙළි වූ කරුණු පදනම් කර ගෙන අධ්‍යක්ෂවරයා විසින් එකී කළමණාකරුවන් ඉවත් කළ හැකිය.

ii. ඉහත 46(2) යටතේ කරනු ලබන ඉවත් කිරීමක් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් වරයා වෙත අභියාචනා කළ හැක්කේ ය.

iii. මෙහිදී අභියාචනයක් ඉදිරිපත් වූ විටදි අවසන් තීරණය ලබා දීම ලේකම්වරයා විසින් කළ යුත්තේ ය.

නඩත්තු කළමනාකරුගේ කාර්යභාරය

47. නඩත්තු කළමණාකරුගේ කාර්යභාරය ඃ

(1) නඩත්තු කළමණාකාරු විසින් කමිටුවේ සෙසු නිලධාරීන්ගේ ද සහයෝගයෙන් යායෙහි වගා ප්‍රදේශ හා ප්‍රමාණ ලේඛනයක් සකස් කර සහතික කර වාරිමාර්ග අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කිරීම.

(2) මෙම නාම ලේඛනයෙහි එක් එක් ඉඩම් හිමියටා හෝ භුක්තිකරුවෙකුට හිමිවන කුඹුරු ඉඩම්වල වපසරියට අනුගතව බෙත්ම ක්‍රමයට හෝ කට්ටි ක්‍රමයට ඔවුන් වෙත ප්‍රධාන වාරිවේල්ල, ප්‍රධාන බෙදුම් ඇළ හා වැකන්ද ශුද්ධ කිරීම සහ නඩත්තු කිරීම සඳහා බෙදා වෙන් කොට භාර දීම.

(3) නඩත්තු කළමණාකරු විසින් එක් එක් ඉඩම් හිමිකරු හෝ භුක්ති කරු වෙත භාරදුන් කොටස යම් ස්ථාවර ක්‍රමයකට සලකුණු කරවීම.

(4) මෙසේ සළකුණු කොට වෙන් කරනු ලබන කොටස සෑම කන්නයක් ආරම්භ වීමට ප්‍රථමයෙන් වැව් ඇති කටු පදුරු කැළය, හුඹස් ඉවත් කොට පස සෝදි යාම නිසා හානි වී ඇති බැම්මේ කොටස් පස් පුරවා මනාසේ සකස් කරවීම,

(5) වැව් බැම්මේ තිරසාර නඩත්තුවට අදාල හඳුනාගත් වෙනත් කටයුතු වාරි මාර්ග සංවර්ධන කමිටු සාමාජිකයන්ගේ දායකත්වය තුලින් ඉටු කිරීම.

(6) වාරි කර්මාන්තයේ සීමා මායිම් සහ රක්ෂිත භූමි සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙහෙයවීම.

48. ජල කළමනාකරුගේ කාර්යභාරය : ජල කළමණාකරුගේ කාර්යභාරය

(1) වාරි මාර්ග ආරක්ෂා කිරිමට කටයුතු කිරීම,

(2) වාරි ක්‍රමවලට හානි පමුණුවන්නන් නීතිය ඉදිරියට ගෙන යාමට වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවට සහාය දීම.

(3) ජලාශ හා වාරික්‍රම වලින් නිකුත් කෙරෙන ජලය ආරක්ෂා කිරිම.

(4) වගා සැලසුම් කාල සටහනක් අනුව ජල කළමනාකරණ කටයුතු මෙහෙයවීම.

(5) ජලය බෙදා හැරීම සඳහා කමිටුව විසින් අනුමත කරනු ලබන සැලසුම් අනුව කාලගුණික හා දේශගුණික සාධක සලකා බලමින් ජල අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් අනතුරුව ජලය නිකුත් කිරීම.

(6) ජල නාස්තිය අවම කිරීමට කටයුතු කිරීම.

49. පැළෑටි කළමනාකරුගේ කාර්යභාරය : පැළෑටි කළමනාකරුගේ කාර්යභාරය

(1) වාරි කර්මාන්තයේ ඇති ආක්‍රමණික ජලජ පැළෑටි වර්ග හඳුනා ගැනීම.

(2) ආක්‍රමණික ජලජ පැළෑටිවල හානිය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම.

(3) ආක්‍රමණික ජලජ පැළෑටි ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

(4) වාරි කර්මාන්තයෙන් ඉවත් කරන ජලජ පැළෑටි භාවිතා කර කරනු ලබන කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ කටයුතු අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම.

(5) මිරිදිය ධීවර වැඩසටහන් සඳහා කමිටුවට සහායවීම.

50. (1) මෙම ප්‍රඥප්තියේ 47(2) උප වගන්තියෙන් බෙදා වෙන්කොට දෙනු ලබන පංගුව මනාසේ පවත්වාගෙන නොයන ඉඩම් හිමියෙකු ගේ හෝ භුක්තිකරුවෙකුගේ කොටස වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුව විසින් ශුද්ධ කරවා ඒ සඳහා වැය වූ මුදල සහ අනෙකුත් වියදම් ගෙවන ලෙස පැහැර හැරීම් කළ තැනැත්තාට කමිටුව විසින් ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවිය යුතු ය. පැහැර හැරීම සම්බන්ධ විධිවිධාන

(2) එම දැන්වීම ලැබී දින 14ක් ඇතුළත එම මුදල ගෙවීමට අපොහොසත් වූවහොත් ඔහු විසින් එම ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය.

(3) මෙම ප්‍රඥප්තියේ 50(2) හි වරද සිදු කරනු ලැබූ විට පරීක්ෂණයකින් පසු වාරි කළමනාකරණ සහතිකය මත කමිටුව විසින් ඒ ඉඩම පිහිටි අධිකරණ බල සීමාව අයත් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කර ලඝු නඩු විභාගයක් පවත්වා ඒ මුදල් ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක ආකාරයෙන් අයකර ගනු ලැබිය යුතු ය. එසේ අයකරනු ලබන මුදල අදාල වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ අරමුදලට බැර කළ යුතු ය.

(4) මෙම ප්‍රඥප්තියේ 50(3) උප වගන්තියෙන් කාර්යය සඳහා වාරි මාර්ග අධ්‍යක්ෂ විසින් හෝ ඒ වෙනුවට බලය දෙන ලද යම් නිලධාරියෙකු ගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක නම් සඳහන් තැනැත්තා විසින් ගෙවීම් පැහැර හැර ඇති මුදල වශයෙන් එම සහතිකයේ සඳහන්

මුදල් ප්‍රමාණය වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවට ගෙවිය යුතු බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතු ය.

(5) මෙම ප්‍රඥප්තියේ 50(4) උප වගන්තියේ සඳහන් සහතිකය සනාථ කිරිම සඳහා යම් සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලයක් නැත්තේ ය.

*V වන පරිච්ඡේදය*

***වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටු පිහිටුවීම සහ ඒවායේ බලතල***

වාරි පද්ධති කළමනාකරණ සහ සංවර්ධන කමිටු පිහිටුවීම

51. මෙම ප්‍රඥප්තියේ 38 වගන්තිය යටතේ පිහිටුවා ගන්නා ලද වාරි මාර්ග හා සංවර්ධනය කමිටු බල ප්‍රදේශවල භෞතික පිහිටීම පදනම් කරගෙන වාරි මාර්ග අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලබන එකී වාරික්‍රම හෝ එල්ලංගාව වෙනුවෙන් "වාරි පද්ධති කළමනාකරණ සහ සංවර්ධන කමිටුව" නමින් කමිටුවක් පිහිටුවිය හැක්කේ ය.

වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුව නීතිගත ආයතනයක් බව

52. වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුව පළාත් වාරි කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයෙහි ලියාපදිංචි විය යුතු අතර එය අව්ච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් වාරිමාර්ග වලට අදාල සියළු කටයුතු ඉටු කිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසකට කරුණු කීමට ද බලය ඇති නීතිගත ආයතනයක් වන්නේ ය.

වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ සාමාජිකත්වය

53. කමිටු බල ප්‍රදේශය තුළ වාරිමාර්ග හෝ යාය මට්ටමින් පිහිටුවා ඇති වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවල ප්‍රධාන නිලධාරීන් තිදෙනා වන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තිදෙනා වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ සාමාජිකයන් වන්නේ ය.

වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ නිලධරි මණ්ඩලය කාරක සභාව ධුර කාලය හා ව්‍යවස්ථාව

54. (1) පද්ධතියේ වාරිමාර්ග නියෝජනය වන සේ සභාපති, ලෙක්ම්, භාණ්ඩාගාරික යනුවෙන් ප්‍රධාන නිලධාරීන් තිදෙනෙක් වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ පත්කර ගත යුතු ය. මෙහි සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු සඳහා එකම වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවකින් නිලධාරීන් පත්කර නොගත යුතු ය.

(2) මෙම නිලධාරීන් තිදෙනා ද ඇතුළත් වන සේ 11 දෙනෙකුට නොඅඩු කාරක සභාවක් වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් පත්කර ගත යුතු ය.

(3) මෙම කමිටුවේ ධුර කාලය වර්ෂයක් වන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයා විසින් සකස් කර අමාත්‍යවරයාගේ අනුමැතිය ලත් පොදු ව්‍යවස්ථාව අනුව වාරි පද්ධති කළමණාකරන හා සංවර්ධන කමිටුව කටයුතු කළ යුත්තේ ය.

වාරි පද්ධති කළමනාකරණ කමිටුවේ කාර්යභාරය

55. මෙම කමිටුවේ කාර්යයභාරය වන්නේ,

(1) සමස්ථ වාරි පද්ධතියේ සංරක්ෂණ කටයුතු සඳහා කටයුතු කිරීම.

(2) පුනරුත්ථාපන හා සංවර්ධන කටයුතු වලදී පද්ධතියේ වාරික්‍රම වල ප්‍රමුඛත්වයන් තීරණය කිරීම.

(3) පද්ධතිය පුරා පිහිටි වාරි රක්ෂිත ආරක්ෂා කිරීම.

(4) පද්ධතියේ සියලු වාරික්‍රම ආශ්‍රීත උස්බිම් සංවර්ධනය කිරීමට සහාය දීම.

(5) රීති හා නියෝග මඟින් පනවනු ලබන වාරි පද්ධතියක තිබිය යුතු අංගෝපාංග වෙන් කිරීම හා ආරක්ෂා කිරීමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහාය වීම.

(6) ඒකාබද්ධ සංවර්ධනයක් සඳහා පද්ධතිය ඒකකයන් වශයෙන් මෙහෙයවීම.

(7) ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම.

(8) වාරි කර්මාන්තයේ සහ යායේ අපද්‍රව්‍ය කාබනික කොටස් ප්‍රයෝජනයට ගෙන කාබනික පොහොර නිෂ්පාදනය.

(9) ඒකාබද්ධ කෘමි සහ වැල්පැළෑටි මර්ධන ක්‍රම හඳුන්වාදීම සහ ඒකාබද්ධ ගොවිතැන් රටා හඳුන්වාදීම.

(10) ගොවි නිෂ්පාදය අලෙවිකරණය, ගොවීන් දැනුවත් කිරීම සහ පුහුණු කිරීම.

(11) වෙනත් පළාත් හා සම්බන්ධ වන එල්ලංගා පද්ධති සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## *VI වැනි පරිච්ඡේදය*

### *පොදු විධිවිධාන*

56. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන සෑම වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් සහ වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් සඳහාම රාජ්‍ය බැංකුවක ගිණුමක් ආරම්භ කොට පවත්වාගෙන යා යුතු ය. *ගිණුමක් ආරම්භ කල හැකි බව*

57. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සලසා ඇති රාජ්‍ය සංස්ථාවක ගිණුම් විගණනය කරනු ලබන ආකාරයට කමිටුවල ගිණුම් විගණනයට භාජනය කළ යුතු ය. *ගිණුම් විගණනය*

58. සෑම වාරි කළමණාකරණ හා සංවර්ධන කමිටුවක් හා වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් විසින්ම තම ධුර කාලය ආරම්භ වී මාස 12 (මාස දොළහ) ඉකුත් වූ දින සිට සති 02ක් (සති දෙකක්) ගතවීමට පෙර කමිටුවේ ගිණුම් වාර්තාව වාරිමාර්ග අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය පවරන අයෙකු වෙත අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ආකෘතියට අනුව භාර දිය යුතු ය. *ගිණුම් වාර්තා අධ්‍යක්ෂවරයා වෙත භාරදීම*

59. පනවා ඇති සහ ඉදිරියේ දී පනවනු ලබන සීමාවන් යටතේ සෑම වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් හා වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවකට මහ සභාව විසින් තීරණය කරනු ලබන කොන්දේසිවලට හා අධ්‍යක්ෂවරයාගේ අනුමැතියට යටත්ව ගිවිසුම්වලට එළඹීමේ බලය ඇත්තේ ය. *ගිවිසුම් වලට එළඹීමේ සීමා*

60. කිසියම් වූ ආයතනයක්, සංවිධානයක් හෝ කණ්ඩායමක් විසින් කුමන ආකාරයේ හෝ වාරි කර්මාන්තය පුනරුත්ථාපනය කිරීම, සංවර්ධන කිරීම හෝ, සංරක්ෂණය කිරීමට අදහස් කරන්නේ නම් නියෝග වලින් පනවා ඇති ක්‍රියා මාර්ගය අනුගමනය කොට වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව ඒ සඳහා වාරි මාර්ග අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය. *වාරි කර්මාන්ත පුනරුත්ථාපනය සංවර්ධනය හා සංරක්ෂණය සඳහා අනුමැතිය*

මෙම අනුමැතිය ලබාදීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ සෑහීමට පත්වන අයුරින් පසු නිරීක්ෂණ වැඩසටහන් තිබිය යුතු අතර, වාරි කළමනාකරණ කමිටුවේ එකඟතාවය සහ දායකත්වය ලබාදීමට එම සංවිධානය එකඟවිය යුතු ය.

61. (1) ප්‍රඥප්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. *නියෝග සෑදීමේ බලය*

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර එසේ පළකරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් ඉන් පසු දිනයක සිට හෝ ඒ නියෝග ක්‍රියාත්මක විය යුතු ය. අමාත්‍යවරයා විසින් සාදනු සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාව ඉදිරියේ තැබිය යුතු ය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, ඒ යටතේ කලින් කරුණු ලැබූ යම් දෙයකට අගතියකින් තොරව එම අනනුමැතියේ දින සිට පරිච්ඡින්න විය යුතු අතර, ඒ පිළිබඳ නිවේදනයක් *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබිය යුතු ය.

62. (1) ලියාපදිංචි වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් හෝ වාරි පද්ධති කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් පහත සඳහන් කාරණා එකක් හෝ කිහිපයක් මත ලියා පදිංචිය අවලංගු කිරීම සඳහා සහ ගණන් බේරා වසා දැමීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් ඈවරකරුවෙකු පත් කළ හැකි වන්නේ ය. *පදිංචිය අවලංගු කිරීම හා ඈවර කිරීම*

(i) කමිටුවේ සාමාජික සංඛ්‍යාව දොළහකට අඩු වීම,

(ii) එක් අවුරුද්දක් ඉක්මවන කාල පරිච්ඡේදයක් කමිටුව ක්‍රියාත්මක නොවීම,

(iii) කමිටුවේ පරමාර්ථ වලට පටහැනිව කමිටුව කටයුතු කර තිබීම,

(iv) කමිටුව එහි සාමාජිකයින්ගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීමට අපොහොසත් වී ඇතිබව ප්‍රකාශ කරමින් එම කමිටුවේ සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකකට (1/4) කට නොඅඩු සංඛ්‍යාවක් විසින් අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කිරීම.

(2) ඉහත 64.1 උප වගන්තිය යටතේ පත්කළ ඈවරකරුට පහත සඳහන් බලතල ඇත්තේ ය.

(i) කමිටුවේ ණය හිමියන් අතර ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් තීරණය කිරීම.

(ii) කමිටුවේ දේපළ විකිණීම.

(iii) ලේකම්වරයාගේ පූර්ණ අනුමැතිය ඇතිව කමිටුව විසින් හෝ ඊට එරෙහි හිමිකම් පෑම් කිසිවක් සමථයකට පත් කිරීම,

(iv) කමිටුවේ වත්කම් නියමිත ආකාරයෙන් බෙදා හැරීම.

(3) ඈවරකරු විසින් කරනු ලබන අවලංගු කිරීම පිළිබඳ නිවේදනය පිළිවෙලින් සිංහල. දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සංස්කරණය වන ප්‍රවෘත්ති පත්‍රයක පළකරනු ලැබිය යුතු ය.

(4) කමිටුව ඈවර කිරීමේදී එහි අරමුදල ඈවර කිරීමේ වියදම් පියවීම සඳහා ප්‍රථමයෙන් යෙදවිය යුතු අතර ඉක්බිතිව එහි බැරකම් වලින් නිදහස් වීම සඳහා යෙදවිය යුතු ය. ඈවර කිරීම නිම කිරීමෙන් පසුව ඉතිරිවන අතිරික්තය පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

*VII වන පරිච්ඡේදය*

***වැරදි හා දණ්ඩනය***

වැරදි

63. (1) යම් තැනැත්තෙක්, යම් වාරි මාර්ගයකට, ජල මාර්ගයකට, ඉවුරකට, වැවකට, වේල්ලකට, වැවක ප්‍රවේශයකට, වාරි කර්මාන්ත සංචිතයකට, සොරොව්වකට, පාලමකට, වානකට, වැව් තාවුල්ලකට, ඇළකට, දොළකට, දිය පාරකට, දිය උල්පතකට, ජල රක්ෂිතයකට, වාරිමාර්ග රක්ෂිතයකට, ඕඩයකට, කඳුරකට, පතහකට, ගංගාවකට, අමුණකට වාරි ඉදිකිරීමට හෝ වාරි කර්මාන්ත සම්බන්ධ මාර්ගයකට කුමන හෝ ආාකරයකින්,

I. අවහිර කරනු ලැබීම,

II. බාධා කරනු ලැබීම,

III. අයිති භූමිය අනවසරයෙන් කොටුකර ගනු ලැබීම,

IV. බාධා කිරීමට හෝ කොටුකර ගැනීමට කටයුතු සැලැස්වීම,

V. අලාභ හානි කිරීමට කටයුතු කිරීම,

VI. අයිති ජලය, ඕනෑකමින් හෝ ද්වේෂ සහගතව අපතේ හැරීමට කටයුතු කිරීම.

VII. සම්බන්ධ ප්‍රදේශයක් තුළ ගොවිතැන් කිරීම,

VII. සම්බන්ධ ප්‍රදේශයකින් අනවසරයෙන් පස් හෝ වැලි ඉවත් කිරීම හා හෝ ඉවත් කිරීමට සැලැස්වීම

VIII. සම්බන්ධ ප්‍රදේශයකට අනවසරයෙන් පස් වැලි බොරළු ගල් හෝ එවැනි වෙනත් දේ පිටතින් රැගෙන විත් දැමීම.

X. අපද්‍රව්‍ය මුදා හැරීමට සැලැස්වීම හෝ යාමට ඉඩහැරීම හෝ පිටතින් ගෙනවිත් දැමීම.

XI. සතුන් වාහන හෝ යන්ත්‍ර සූත්‍ර මගින් හානි සිදු කිරීම හෝ සිදු කිරීමට සැලැස්වීම.

XII. ඉහත සඳහන් කාරණා සඳහා ආධාර හා අනුබල දීම.

මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේ ය.

(2) හඳුනාගත් නිශ්චිත වාරි කළමනාකරණ පද්ධතියක් තුළ වාරි කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව මිස, ගොවිතැන් කටයුතු කිරීම සඳහා වගා ලිඳක් කැණීම, ඉදිකිරීම හෝ පවත්වාගෙන යාම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේ ය.

(3) වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුව වගා කටයුතු පිළිබඳව පවත්වන රැස්වීමකදී ගන්නා ලද තීරණ වලට පටහැනිව කටයුතු කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේ ය.

64. මෙම ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන යම් නියෝග යටතේ වූ යම් වරදක් හෝ සම්බන්ධනේ යම් පුද්ගලයෙකුට විරුද්ධව මහේස්ත්‍රාත් වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකින් හෝ මාස 6ක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩය හා බන්ධානාගාරගත කිරීම යන දඬුවම් දෙකින්ම හෝ දඬුවම් ලැබීමට යටත් විය යුතු වන්නේ ය. දණ්ඩනය

*VIII වන පරිච්ඡේදය*

**අර්ථ නිරූපන**

65. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

(1) "පළාත් සභා" යන්නෙන් වයඹ පළාත් සභාව අදහස් වේ.

(2) "විෂය භාර අමාත්‍යවරයා' යන්නෙන් වයඹ පළාත් සභාවේ වාරිමාර්ග විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

(3) "ලේකම්වරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ වාරිමාර්ග විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා අදහස් වේ.

(4) "පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ඇති වයඹ පළාත් වාරි මාර්ග විෂය භාර දෙපාර්තමේන්තුව අදහස් වේ.

(5) "අධ්‍යක්ෂ" යන්නෙන් වයඹ පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

(6) "කුඹුරු ඉඩම්' යන්නෙන්, වී ගොවිතැන් කරන හෝ වී ගොවිතැන් සඳහා පිළියෙල කළ හෝ මීට කවර දිනක හෝ වී ගොවිතැන් කරන ලදුව තවදුරටත් වී ගොවිතැන සඳහා සුදුසු වන ඉඩමක් අදහස් වේ. ගොවියා විසින් එම ඉඩමට යාබදව හෝ අනුබද්ධිතව පිහිටා ඇති කමත හෝ පැලක් ඉදිකර ගැනීම සඳහා හෝ යොදා ගන්නා ඉඩම් ද ඊට ඇතුළත් වේ.

(7) "භුක්තිකරු" යන්නෙන්, ඉඩමේ හිමිකරු හෝ බදුකරු හෝ උකස් කිරීම හේතුවෙන් හෝ අඳයට ගෙන වගා කිරීම නිසා හෝ කෘෂිකාර්මික ඉඩම් වගාකරන තැනැත්තා අදහස්කරන අතර, ඉඩම්

සංවර්ධන ආඥාපනත යටතේ හෝ වෙනයම් පනතක් යටතේ අන්සතු කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩම් ප්‍රයෝජනයට ගන්නා වූ හා භුක්ති විඳින්නාවූ තැනැත්තා ඇතුළත් විය යුතු අතර අඳ ගොවියෝද ඊට ඇතුළත් වේ.

(8) "වාරිමාර්ග' යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් අර්ථ දක්වා ඇති අන්තර් පළාත් වාරිමාර්ගයක් නොවන වාරිමාර්ගයක් අදහස් වේ.

(9) "එල්ලංගාව" යන්නෙන්, යම් නිශ්චිත බැවුම් සහිත ප්‍රදේශයකින් ආරම්භ වී ගලා බසින ජල ප්‍රවාහයන් වල ජලය එකතු වෙමින් අවසාන වශයෙන් ගංගාවකට, ඔයකට, සම්බන්ධවීමට ප්‍රථම එම ජලය එකතු වන වැව්ද සහිතව පිහිටා ඇති සියලු වාරිමාර්ග පෝෂක ප්‍රදේශ, රක්ෂිත ඇළදොළ, කුඹුරු ද සමන්විත වූ ප්‍රදේශයක් අදහස් වේ.

(10) "නඩත්තු කළමණාකරු/ජල කළමනාකරු/පැළැටි කළමණාකරු" යන්නෙන් ඉහතින් අර්ථ විග්‍රහ කොට ඇති වාරිමාර්ග ක්‍රමයන් වෙනුවෙන් එකී කුඹුරු ඉඩම් වල ඉඩම් හිමි ගොවීන් හෝ භුක්තිකරුවන් වෙනුවෙන් ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු වඩාත් අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසීම සඳහා වාරි කළමනාකරණ හා සංවර්ධන කමිටුව විසින් පත්කර ගන්නා ඉඩම් හිමි ගොවියෙක් හෝ භුක්ති කරුවෙක් අදහස් කෙරේ.

(11) "කමත" යන්නෙන් මිනිස් ශ්‍රමයෙන් හෝ සතුන් යොදා හෝ යන්ත්‍රානුසාරයෙන් හෝ ගොයම් පෑගීම සඳහා හෝ වී හුලං කිරීම සඳහා හෝ අස්වනු සකස් කිරීම සඳහා හෝ ගොයම් රැස්කර තැබීම සඳහා හෝ පිළියෙල කරන ලද නැතහොත් භාවිතා කරනු ලබන බිමක් අදහස් කෙරේ.

12. "වගා ලිඳ" යන්නෙන් විශ්කම්භය අඩි 15ට නොඅඩු හෝ පොළව මට්ටමේ සිට ගැඹුර අඩි 20ට නොඅඩු හෝ ස්ථිර බැම්මක් යොදා සකස් කරන ලද, භෝග වගාවන් සඳහා කාලීනව අවශ්‍ය වන ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකියාව ඇති ළිඳක් අදහස් වේ.

(13) "ඉදිකිරීම" යන්නෙන්, යම් වාරිමාර්ගයක් වැඩි දියුණු කිරීම, ව්‍යාප්ත කිරීම, යම් අතහැර දමන ලද වාරි මාර්ගයක් අලුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණ කිරීම, යම් වාරි මාර්ගයක හෝ ඒ යටතේ ජලය සැපයෙන ප්‍රදේශයක හෝ එම කාර්යයෙහි හෝ ප්‍රදේශයේ යම් කොටසක ආරක්ෂාව සඳහා ගන්නා වූ යම් ක්‍රියා මාර්ගයක් අදහස් වේ.

(14) "පැල" යන්නෙන්, වගා කටයුතු කරගෙන යාමේදී පරිහරණය සඳහා වගා බිමෙහි ඉදිකරනු ලබන ස්ථිර වහලයක් නොමැති කණු මත ඉදිකරනු ලබන පිටත බිත්ති ආවරණය නොකළ තාවකාලික ඉදිකිරීමක් අදහස් වේ.

(15) "කෘෂිකර්මය" යන්නෙන් ජනතාවගේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස වාණිජමය අරමුණු සහිතව හෝ රහිතව සියළුම ප්‍රයෝජනවත් ශාක වගා කිරීම සහ සංරක්ෂණය කිරීම.

(16) "වනාත" යන්නෙන් කෘෂි කර්මාන්තයේ භෝග වගා කරන කෘෂි භූමියට හානියක් වන අයුරින් පිහිටා ඇති කැළෑ කොටස්.

(17) "තිරසාර නඩත්තුව" යන්නෙන් යහපත්ව හා ක්‍රමවත්ව අඛණ්ඩ ලෙස අදාල වාරි කර්මාන්තය පවත්වා ගැනීම අදහස් වේ.

(18) "අනවසර ඉදි කිරීම්" යන්නෙන් වාරි මාර්ගයකට අදාලව පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයාගේ අනුමැතියකින් තොරව සිදු කරනු ලබන කුමන හෝ ඉදි කිරීමක් අදහස් වේ.

(19) "ව්‍යාපෘතිය" යන්නෙන් වාරිමාර්ග ක්‍රම හෝ විකල්ප වාරි ප්‍රභවයන් උපයෝගී කර ගනිමින් තීරණය කර ගත් කාල රාමුවකට අනුව නිශ්චිත මුල්‍ය සීමාවක් තුළ භෞතික හා මානව සම්පත් උපයෝගී කර ගනිමින් කෘෂිකාර්මික සංවර්ධනය හෝ වෙනත් සුවිශේෂී අපේක්ෂාවන් ඉටු කර ගැනීම සඳහා සැලසුම් කරන ලද සාමූහික ක්‍රියාවලියක් අදහස් වේ.

(20) "වැඩසටහන" යන්නෙන් වාරි මාර්ග යෝජනා ක්‍රම හෝ විකල්ප වාරි ප්‍රභවයන් උපයෝගී කර ගනිමින් නිශ්චිත වූ අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සමූහයකින් සමන්විත වැඩපිළිවෙලක් අදහස් වේ.

66. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විටක සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

09-105

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

3—PG 2151